# උදෑසන

# යාච්ඤා



"ඔබ මරණය දක්වා විශ්වාසී ව සිටින්න. එවිට මම ඔබට
ජීවන කිරුළ ප්‍රදානය කරමි"

එළිදරව්ව 2:10

# යෙහෝවා අපේ දෙවිදානෝය

**ගී**තිකාකරු පවසන්නේ: ''ස්වාමීන්වහන්සේ සියල්ලන්ට ම කරුණාවන්ත ය. උන්වහන්සේගේ දයාබරකම් උන්වහන්සේගේ සියලු කාර්යයන් කෙරෙහි පවතින්නේ ය'' (ගීතා. 145:9)

මෙම වාක්‍යය සර්ව සම්පූර්ණ දේ සමන්විත විශ්වයේ ඉහළ ම සීමාවන් වැළඳ ගනී, එය විශ්වයේ ඉතා කුඩාම හා විශාලතම ජීවීන්ගෙන් සමන්විත ය. සියලු ජීවීන් ඇත්තේ උන්වහන්සේගේ අධීක්ෂණය යටතේ ය. අපේ දෙවි යෙහෝවා මුළු ලෝකයේ ම රාජාධිරජානෝ ය. එතුමන්ගේ ඥානය, බලය, කරුණාවන්තකම සහ පුළුල් මනස මෙබඳු උසස් තනතුරක වගකීම්වලින් බහුල ලෙස පිරී තිබේ. එවැනි වගකීමකට සුදුසු කෙනෙකුගේ මානසික හැකියාව තේරුම් ගැනීමට උත්සාහ කිරීමේ දී මිනිස් මොළය පැකිලෙනු ඇත. කිසිදා අසාර්ථක නොවන මතකයක්, කිසිදා අසාර්ථක නොවන විනිශ්චයන්, සදාකාලිකත්වය සඳහා සැලසුම් කිරීමට කිසි විටෙකත් අසමත් නොවන, විවිධ යුග සඳහා දෝෂයකින් තොරව සැලැස්ම සකස් කරන ඥානය, ජීවී අජීවී සියලු විරුද්ධවාදිකම් මත ආධිපත්‍යය දරමින් උන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ සැලැස්මට එකඟව මනුෂ්‍යයාට මඟ පෙන්වීමේ බලය සහ හැකියාව, විශ්වය ආරක්ෂා කිරීමේ දී ඇතිවන පීඩනයේ වෙහෙසට පත් නොවන සදාකාලික නිරීක්ෂණය, කිසි දිනක නොනිදන ඇස්, සැමවිට විවෘතව ඇති කන්, සියලු අවශ්‍යතා දන්නා සහ ඔහුගේ අති විශාල ආධිපත්‍යයේ සියලු දේවලින් පිරී සිටින දෙවියන් වහන්සේ ගැන එක් මොහොතක් සිතා බලන්න. **R 1560:2**

# 1 කොරින්ති 13

මම මනුෂ්‍යයන්ගේ භාෂාවලින් හා දේවදූතයන්ගේ භාෂාවලින් කථා කරන්නෙමි. නමුත්, මට ප්‍රේමය නැත්නම්, මම ඝෝෂා කරන ඝණ්ඨාරයකට හෝ කටුක රාවය දෙන කෙතාලමකට හෝ සමාන වෙමි.

දිවැසි වැකි දෙසීමේ වරම මට තිබුණත්, සියලු අබිරහස් ගැන අවබෝධය ද සකල ඥානය ද මට ඇතත්, කඳු සෙලවීමට තරම් බලවත් විශ්වාසයක් මට තිබුණත් ප්‍රේමය මට නැත්නම් මම හිස් තැනැත්තෙක්මි.

දන් දීම සඳහා මා සතු සියල්ල වෙන් කළත්, මාගේ සිරුර ගිනි පූජාවක් සඳහා බිලි දුන්නත්, ප්‍රේමය මට නැත්නම් මට කිසි පලක් නැත.

ප්‍රේමය, ඉවසිලිවන්ත ය, කරුණාවන්ත ය, ප්‍රේමය, ඊර්ෂ්‍යා වන්නේ නැත, පාරට්ටු කරගන්නේ නැත, උඩගු වන්නේ නැත.

ප්‍රේමය, අවිනීත නොවේ, ආත්මාර්ථකාමී නොවේ, තරහ නොගනී. ප්‍රේමය, අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී, හරි දේ ගැන ප්‍රීති වෙයි.

ප්‍රේමය, සියල්ල උසුලයි. ප්‍රේමයෙහි, විශ්වාසයට ඉමක් නැත, බලාපොරොත්තුවට නිමක් නැත, ඉවසීමට අගක් නැත.

ප්‍රේමය සදාතනික ය. දිවැස් වැකි වුව ද පහ ව යන්නේ ය. විවිධ ශබ්ද දෙසීම් වුව ද නිම වන්නේ ය. ඥානය වුව ද නැති වන්නේ ය.

මන්ද, අපේ ඥානය අසම්පූර්ණ ය, දිවැස් වැකි දෙසීම ද අසම්පූර්ණ ය. සම්පූර්ණ දේ පැමිණි විට, අසම්පූර්ණ දේ පහ ව යන්නේ ය.

බාල වියෙහි දී මම බාලයෙකු මෙන් කතා කෙළෙමි. බාලයෙකු මෙන් සිතුවෙමි. බාලයෙකු මෙන් තේරුම් ගතිමි. එහෙත් මම දැන් වයසින් මුහුකුරා සිටින බැවින් ළාමක දේ අත් හැර සිටිමි. දැන් අපට කැඩපතකින් මෙන් පැහැදිලි ව පෙනෙන්නේ ය. අපි මුහුණට මුහුණ ලා දකින්නෙමු. දැන් මාගේ දැනුම අසම්පූර්ණ ය. එහෙත් ඉදිරි කාලයේ දී, මා පිළිබඳ දෙවියන් වහන්සේගේ දැනුම මෙන් මාගේ දැනුම ද සම්පූර්ණ වන්නේ ය.

ඇදහිල්ල, බලාපොරොත්තුව හා ප්‍රේමය සදහට ම පවතින ධර්මතා තුනකි. මෙයින් ශ්‍රේෂ්ඨතම වන්නේ ප්‍රේමයයි. **R 2205:6; 2234:5; 2240:1**

# දෙවියන්ගෙන් එක් පොරොන්දුවක්

**ස්**වර්ගයෙහි සිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමය පරිශුද්ධ වේවා.

ඔබේ දිවුරුම මගේ හදවත ජය ගෙන, ඔබේ කැමැත්ත මාගේ විනාශ වන මාංශයේ ඉටු වේවා. අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මාර්ගයෙන් මම මෙම පොරොන්දුව ලබා දෙන්නේ, අවශ්‍ය අවස්ථාවල දී මට උපකාර කිරීමට ඔබවහන්සේගේ කරුණාව මත විශ්වාසය තබමිනි.

අස්වැන්න නෙළීමේ කාර්යයන් හිදි, විශේෂාකාරයෙන්, ඕනෑකමෙන් සහ උනන්දුවෙන් සහභාගිවීමට මට ලබා දී ඇති කාර්යභාරයන් සහ අනෙකුත් සෑම තැනකම්දි ම හැමදාම මම ස්වර්ග රාජ්‍යයෙහි අනුග්‍රහය සිහිපත් කරමි.

මීට අමතරව, ඔබට සහ ඔබේ ආදරණීය රැළට සේවය කිරීමට මට හැකි වන පරිදි මගේ සිතුවිලි, වචන සහ ක්‍රියාවන් ගැඹුරින් පරීක්ෂා කිරීමට මම පොරොන්දු වෙමි.

ස්වාමිවරුන් දෙදෙනෙකු සිටින බව මතක තබා ගනිමින්, අශුද්ධාත්මයන් හා සම්බන්ධ සියලු කුරිරුකම්වලට එරෙහි වීමට මම අවදියෙන් සිටින බව ඔබට සහතික වෙමි, මේ සියල්ල ම සාතන්ගේ උගුල් බව වටහාගෙන, සෑම සාධාරණ ආකාරයකින් ම ඒවාට එරෙහි වීමට පොරොන්දු වෙමි.

ඉහත සහ පහත ඇති ව්‍යතිරේඛ හැරුණු විට, සෑම අවස්ථාවකදීම, සෑම තැනකදීම, මම විරුද්ධ ලිංගයේ අය කෙරෙහි දෙවියන් වහන්සේගේ සෙනඟ සිටින ශුද්ධවූ සභාව ඉදිරිපිට හැසිරෙන ආකාරයටම මම තනිව සිටින විටත් හැසිරෙන බව ඔබට පොරොන්දු වෙමි.

**ව්‍යතිරේඛය** - සහෝදරයක් නම් - බිරිඳ, දරුවන්, මව සහ සහෝදරියන් : සහෝදරියක් නම් - සැමියා, දරුවන්, පියා සහ සහෝදරයන්.

එසේම, කාමරයේ දොරවල් විවෘතව නොමැති නම්, හැකි සෑමවිටම විරුද්ධ ලිංගයේ අය සමඟ එකම කාමරයේ තනිව සිටීමෙන් මම වැළකී සිටිමි.
**R 4191:5,6; 4263:6; 4382:3; 4383:1**

## ඔබේ දෑස් වසාගෙන මෙනෙහි කරන්න

**මො**හොතකට ඔබේ ඇස් වසාගෙන, පාපය නිසා තවමත් සිදුවෙමින් පවතින සියලු දුක්ඛිත තත්වයන්, උපේක්ෂාවන් ඔබේ ඇස් ඉදිරිපිට තබා, ස්වර්ග රාජ්‍යයේ තේජස ඔබේ මනස ඉදිරිපිට ගෙන තබන්න.

පාපය නව සමාජයේ සාමය හා සන්සුන්භාවය විනාශ කරනු ඇත. ප්‍රේමයට නපුරු සිතුවිල්ලක්, ආදරය නැති බැල්මක් හෝ වචනයකින් බලපෑමක් ඇති නොවේ. උල්පතක් මෙන් ආදරය ගලා එනු ඇත, එය අන් අයට මිත්‍රශීලී ප්‍රතිචාරයක් සහ ආදර්ශයක් වනු ඇත. රෝගයන් එහි නොරැඳෙනු ඇත. එහි වේදනාවක්, දුක්ඛ්‍යයක්, විනාශයක්, බියක් නැත. යහපත් සෞඛ්‍යය, මින් පෙර කිසිදා නොදුටු මිනිසෙකුගේ පරිපූර්ණ සුන්දරත්වය, පරිපූර්ණ මනුෂ්‍ය වර්ගයා සහ කල්පවත්නා ආදරය එහි පවතිනු ඇත, මනසෙහි අභ්‍යන්තර පරිශුද්ධභාවය සහ යුක්තියේ පරිපූර්ණත්වය එහි දක්නට ලැබෙන අතර සෑම දෙයක් ම පැහැදිලිව හා මධ්‍යස්ථව උසස් තැනකට නංවනු ඇත. පොළොවේ ක්‍රියාකාරකම් එබඳු ය. මේ අනුව නැවත නැගිටීමේ කාර්යය අවසන් වූ පසු, මළවුන්ගේ සියලු හැඬීම් සහ කඳුළු පිස දමනු ඇත. (**එළිදරව් 21:4 A 191; R 612:6** )



## ගීතාවලිය 23

**ස්**වාමීන්වහන්සේ මාගේ එඬේරානෝය. මට හිඟයක් නොවන්නේ ය.

උන්වහන්සේ නිල් තණබිම්වල මා ලගින්නට සලස්වන සේක. නිශ්චල වූ දිය අසලින් මා ගෙන යන සේක.

උන්වහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත් කර, ස්වකීයනාමය නිසා ධර්මිෂ්ඨකමේ මාවත්වල මා ගෙන යන සේක.

එසේ ම, මම මරණයේ මිටියාවත් මැදින් යන්නෙමි. නමුත්, කිසි උපද්‍රවයකට භය නොවන්නෙමි. මක් නිසා ද ඔබ මා සමඟ ය. ඔබගේ දණ්ඩෙන් හා සැරයැටියෙන් මට සැනසිල්ල ලැබේ.

මාගේ සතුරන් ඉදිරියෙහි ඔබ මට කෑම මේසයක් පිළියෙළ කරන සේක. මාගේ හිස තෙලින් ආලේප කළ සේක. මාගේ කුසලාන උතුරා යයි.

සැබවින් යහපත්කමත් කරුණාවත් මාගේ ජීවිතයේ සියලු දවස්වල මා අනුව එන්නෝය. මම සදාකල්හිම ස්වාමීන් වහස්සේගේ ගෘහයෙහි වාසය කරන්නෙමි. **R 5653**

බ්‍රහස්පතින්දා

# මගේ උදෑසන ප්‍රාර්ථනාව

**ම**ගේ උදෑසන සිතුවිල්ලේ ප්‍රාර්ථනාව වන්නේ,

"ස්වාමීන් වහන්සේ විසින් මට කළා වූ සියලු යහපත්කම්වලට මම උන්වහන්සේට කුමක් දෙම් ද?. මම ගැළවීමේ කුසලාන රැගෙන, ස්වාමීන් වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි. එසේ ය, ස්වාමීන් වහන්සේගේ මුළු සෙනග ඉදිරියෙහි මාගේ භාරයන් උන්වහන්සේට ඉෂ්ට කරන්නෙමි." (ගීතා 116:12-14)

"පුද පූජා ඇතිව මා සමඟ ගිවිසුමක් කළ මාගේ සැදැහැවතුන් මා වෙත රැස් කරන්න." (ගීතා 50:5) යන දිව්‍යමය වචනය සිහිපත් කරමින් මා අධිෂ්ඨාන කරන්නේ මට මඟ පෙන්වන දෙවියන් වහන්සේගේ කරුණාවෙන් අද පරිශුද්ධවූ මා මගේ වගකීම් ඉටු කරන අතර මගේ මාංශය සහ එහි ආශාවන් පරිත්‍යාග කරමින් මගේ ගැලවුම්කරුවානන් සමඟ ස්වර්ගීය නිදහස උරුම කර ගන්නෙමි.

මම සෑම කෙනෙකු සමඟ ම සරලව හා අවංකව සිටීමට උත්සාහ කරමි. මම මගේ කීර්තිය හා ගෞරවය නොසොයා දෙවියන් වහන්සේට පමණක් කීර්තිය හා ගෞරවය පුද කරමි.

මගේ තොල්වලින් මම පරිස්සමින් දෙවියන්ව සිහිපත් කරන්නෙමි. මම සෑම කෙනෙකුට ම මගේ වචනවලින් මෘදු හා ආශීර්වාද වන සේ සිටීමට උත්සාහ කරමි.

මම දෙවියන් වහන්සේට, සත්‍යයට, සහෝදරයන්ට සහ අන් සියල්ලන්ට ම, බොහෝ දේවල්වලින් පමණක් නොව, ජීවිතයේ කුඩා දේවල්වලින් ද උපකාර වීමට උත්සාහ කරමි.

දිව්‍යමය රැකවරණය තුළ මගේ ඉහළ ම යහපත සඳහා වූ සියලු ආශාවන් පරිත්‍යාග කර දිව්‍යමය කරුණාව කෙරෙහි විශ්වාසය තබමින්, ශාරීරික ව පිරිසිදු වීමට පමණක් උත්සාහ නොකර, සියලු මානසික බැඳීම්, සියලු අතෘප්තියන් සහ සියලු දුක්ඛිත තත්වයන් මුළුමනින්ම පිළිකුල් කරමි,

දෙවියන් වහන්සේගේ දිව්‍යමය කරුණාව මත මගේ ජීවිතයට ලැබෙන දුක් කරදර ගැන මම මැසිවිලි නඟන්නේ හෝ දොස් පවරන්නේ නැත. මන්ද,

"කුමක් සිදු වුවද මට දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි විශ්වාසයක් හා ඇදහිල්ලක් ඇත්තේ ය." **R 5165:3,6 5727:6**

# මැතිව් 5:1-16

උන්වහන්සේ සමූහයක් දැක කන්දට නැගුණ සේක. උන්වහන්සේ හිඳගත් කල් හි උන්වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේ වෙතට ආවෝ ය. එවිට උන්වහන්සේ ඔවුන්ට උගන්වමින් මෙසේ කී සේක;

සිතින් දිළින්දෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේ ය.

ශෝකවන්නෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ඔවුහු සැනසීම ලබන්නෝ ය.

මෘදු ගුණ ඇත්තෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ඔවුහු පොළොව උරුම කර ගන්නෝ ය.

ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ඔවුහු තෘප්තියට පැමිණෙන්නෝ ය.

දයාවන්තයෝ ආශීර්වාද ලද්දෝය. මක් නිසා ද ඔවුහු දයාව ලබන්නෝ ය.

සිතින් පවිත්‍රව සිටින්නෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ඔවුහු දෙවියන් වහන්සේ දකින්නෝ ය.

සාමය පතුරුවන්නෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝයයි කියනු ලබන්නෝ ය.

ධර්මිෂ්ඨකම නිසා පීඩා විඳින්නෝ ආශීර්වාද ලද්දෝ ය. මක් නිසා ද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේ ය.

මනුෂ්‍යයන් මා නිසා ඔබ සැමට නින්දා පීඩාකොට ඔබ සැමට විරුද්ධව සියලු ආකාර අගුණ කියන කල ඔබ ආශීර්වාද ලද්දෝ ය.

ප්‍රීතිවන්න, ඉතා සන්තෝෂවන්න. මක් නිසා ද ස්වර්ගයෙහි ඔබ සැමගේ විපාකය මහත් ය. ඔබ සැමට පළමුවෙන් සිටි අනාගතවක්තෘවරුන්ටත් ඔවුහු එලෙසම පීඩා කළෝ ය.

ඔබ සැම පොළොවේ ලුණු ය. නමුත් ලුණුවල ලුණු රස නැතිවුණොත් ඒවා කුමකින් රසකරනු ලබන්නේ ද? එතැන් පටන් ඒවා පිටත දමනු ලබන්ට ද මනුෂ්‍යයන්ගේ පයින් පාගනු ලබන්ට ද මිස අන් කිසිවකට නොවටින්නේ ය.

ඔබ ලෝකයේ ආලෝකය ය. කන්දක් මුදුනෙහි තිබෙන නුවරක් සඟවන්නට නොහැකිය. මනුෂ්‍යයෝ පහනක් දල්වා කුරුණිය යට නොව පහන්රුකක් උඩ තබති. එවිට එයින් ගෙයි සිටින සියල්ලන් කෙරෙහි ආලෝකය බබළවයි.

එසේම, මනුෂ්‍යයන් විසින් ඔබ සැමගේ යහපත් ක්‍රියා දැක ස්වර්ගයෙහි සිටින ඔබගේ පියාණන්වහන්සේට ගෞරව කරනු පිණිස ඔබ සැමගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බැබළේවා. **R 2205:6, 2234:5, 2240:1**